# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
## காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
## LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகதமெதுர", காணிச் செயலகம், 1200/6, ரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretariat, 1200/6, Rajamalwatta Road, Battaramulla.


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>MY NO | 4/1/චක්‍රලේඛ | ඔබේ අංකය<br>உமது இல<br>YOUR NO | |
| | | දිනය<br>திகதி<br>DATE | 2012.05. 1 |

සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන් හා
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

<u>රජයේ ඉඩම් ආඥා පණත යටතේ නිකුත් කරන වාර්ෂික අවසර පත්‍ර (එල්.සී.75) සඳහා භාවිතා කරන ආකෘති අළුතින් මුද්‍රණය කර බෙදා හැරීම.</u>

ඉහත කරුණ සම්බන්ධව මාගේ අංක 7/2011 හා 2011.12.20 දිනැති චක්‍රලේඛය හා ඊට අදාලව නිකුත් කරන ලද 4/1/චක්‍රලේඛ හා 2012.03.20 දිනැති උපදෙස් ලිපියට වැඩිමනත් වශයෙනි.

02. පසුගිය කාල සීමාව තුල ව්‍යාජ වාර්ෂික අවසර පත්‍ර දිවයින පුරා නිකුත් වී ඇති බැව් නිරීක්ෂණය වී ඇති බැවින්, නව වාර්ෂික අවසර පත්‍රයක් නිකුත් කිරීමට පෙර අදාල ඉඩම සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර එම ඉඩම තවදුරටත් වාර්ෂික අවසර පත්‍ර මත ලබා දීම සුදුසු ද යන්න පිළිබඳව පරීක්ෂා කර බැලීමට කටයුතු කිරීම සුදුසුය.

03. එමෙන්ම නියමිත බදු මුදල අය වී නොමැති අවස්ථා වල නියමිත බදු මුදල අය කර ගැනීමට කටයුතු කළ යුතුව ඇත.

04. එලෙසම අළුතින් වාර්ෂික අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමේදී ඉහත 02 ඡේදයේ සඳහන් පරිදි ක්ෂේත්‍ර පරීක්ෂණයෙන් පසු ලැබෙන වාර්තාවද අදාල ලියකියවිලි සමග ඉදිරිපත් කර මාගේ අනුමැතිය ලබා ගත යුතු අතර, එසේ අනුමැතිය ලබා ගත් බවට අළුතින් නිකුත් කරන වාර්ෂික අවසර පත්‍රයේ වම් පස ඉහල කෙළවර අදාල ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන තබා තහවුරු කිරීමට කටයුතු කිරීම සිදු කළ යුතුය.

05. ඒ අනුව ඉහත උපෙදස් පරිදි වාර්ෂික අවසර පත්‍ර සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

ආර්.පී.ආර්. රාජපක්ෂ,
ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත්-

01. ලේකම්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
02. නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - අ.ක.ස.
03. ඉඩම් කොමසාරිස්(ඉඩම්) / නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්(රන්බිම)/ සහකාර ඉඩම් කොමසාරිස් (නීති) - අ.ක.ස.


දුරකථන / தொலைபேசி / Telephone: 011-2797400 | ෆැක්ස් / பெக்ஸ் / Fax: 011-2864051 | වෙබ් ලිපිනය / இணையம் / Web Address: www.landcommdept.gov.lk | ඊමේල් / ஈ-மெயில் / E-mail: landcom@landcommdept.gov.lk